# කුරුළු කූඩුව



සනුලි දිනේත්රා බණ්ඩාර

# කුරැළු කූඩුව

සනුලි දිනේත්‍රා බණ්ඩාර

**කතෘ ප්‍රකාශනයකි**

**2023**

ISBN : 978 – 624 -206 -814 -5

# පිදුම

**මගේ පන්ති භාර ගුරුතුමිය වන**

**තිලකා ගුණතිලක ගුරුතුමියට**

**ආදරයෙන් පිළිගන්වමි**

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතටින් ජීවත් වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන් ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාවයි . එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරිම තුළින් ගෝලීය සමාජයට ගැලපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි.එම ජාතිය අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුමකරගත් මහමායා දියණියන් වසර ගනනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොට ගෙන ග්‍රන්ථකරණයට යොමු කිරිමේ ප්‍රතිපලයක් ලෙස දේශිය සාහිත්‍ය කෙතේ ලේඛන අංකුර දහස් ගනනක වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරා ලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවිමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවන්ට ගැළපෙන ලෙස නවීකරණය කරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදි.  දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙනිම ගත් කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් සහෝදරත්වයෙන් අප හා එක් වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල වාසානි සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කාතිය තුළින් ලඅබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතියි.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

මහනුවර

2023.11.01

එක දවසක් අපේ ගෙදර කුරුල්ලෙක් හා කිරිල්ලියක් කූඩුවක් හදනවා මම දැක්කා. ඒ දෙන්නා ගොඩක් මහන්සි වෙලා කූඩුව හැදුවා.



දවසක් අයියායි මමයි සෙල්ලම් කරමින් ඉන්න කොට වේගයෙන් හුළඟක් හැමුවා.



අපි දෙන්නා දුවගෙන ගෙට ගියා. හුළඟත් එක්ක වැස්සක් වැස්සා.



පහුවදා අයියයි මමයි එළියට ගිහින් බැලුවා. වත්ත පුරාම කොළ වැටිලා. ගස්වල අතුවැටිලා.



අයියයි මමයි වත්ත සුද්ද කරා. ඒ අතරේ මම දැක්කා කුරුල්ලයි කිරිල්ලියි කෑ ගසමින් පියාඹනවා.



අතුගාන අතරේ අයියා එක පාරටම කෑ ගැසුවා. "නංගි එන්න

මේ බලන්න" මම ඉක්මනට දුවගෙන ගියා.



ගස්වල අතු අස්සේ කුරුළු කූඩුව බිම වැටිලා තිබ්බා. අයියා හෙමින්

කූඩුව අතට ගත්තා. එකේ පොඩි කුරුළු බිත්තර තුනක් තිබ්බා.



අපි දෙන්නා හෙමින් කූඩුව ගහ උඩින් තිබ්බා. කුරුළු අම්මයි තාත්තයි සතුටින් ගහ වටේ කෑ ගසමින් ඉගිලුනා.



ටික දවසක් යන කොට ගහ උඩින් කුරුල්ලෝ කෑගසනවා ඇහුණා. අයියයි මමයි ගිහින් බැලුවා. කුරුළු කූඩුවේ ලස්සන කුරුළු පැටව් තුන්දෙනෙක් හිටියා.



අපි දෙන්නට හරිම සතුටුයි. එදා අපි කුරුළු බිත්තර ටික බේර ගත්ත නිසා නේ අද මේ පැටව් ඉන්නේ.



# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම ඔවුන් ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප් නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරණ ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදි.ඒ යටතේ ග්‍රන්ථ වැඩිම ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුල ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලගාවීමට නූතන තාක්ෂණය වා බැඳුනු විද්‍යුත් කෘති රචනා කරන්නට විය.ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබා දෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතර ම ඔවුන් ගේ හැගීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රිය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි.මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මග පෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැලසුම් කරුවන්ට මෙන්ම වගකිව යුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහමයා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත් කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට

සෙනවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023.11.01

ISBN : 978 – 624 – 206 – 814 -5